// ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය
අති විශෙෂ

අංක 2180/18 - 2020 ජුනි මස 16 වැනි අඟහරුවාදා - 2020.06.16

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### 1981 අංක 1 දරන පාර්ලිමේන්තු මැතිවරණ පනත

25 (3) වන වගන්තිය යටතේ දැන්වීම

(අ) 2020 අගෝස්තු මස 05 වැනි දින පැවැත්වීමට නියමිත මහ මැතිවරණයේ දී අංක 6 දරන නුවරඑළිය මැතිවරණ කොට්ඨාසය වෙනුවෙන් ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ පක්ෂය විසින් නාමයෝජනා කරනු ලැබූ අපේක්ෂකයකු වූ ආරුමුගන් තොන්ඩමන් මහතාගේ මරණය 2020 මැයි මස 26 වැනි දින සිදු වූ බව ද ;

(ආ) ඒ මරණය සිදු වුව ද, එකී ආරුමුගන් තොන්ඩමන් මහතාගේ නම අත්හැරුණු ලැබූ සහ 1981 අංක 1 දරන පාර්ලිමේන්තු මැතිවරණ පනතේ 25 වන වගන්තියේ (2) වන උපවගන්තිය යටතේ ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ පක්ෂය විසින් නාමයෝජනා කරන ලද ජීවන් තොන්ඩමන් මහතාගේ නම ඇතුළත් කරනු ලැබූ ඒ මැතිවරණ කොට්ඨාසය වෙනුවෙන් ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ පක්ෂය විසින් ඉදිරිපත් කරන ලද නාමයෝජනා පත්‍රය වලංගු බව ද ඉහත කී පනතේ 24 වැනි වගන්තිය යටතේ පළකරන ලද දැන්වීමේ සඳහන් පරිදි 2020 අගෝස්තු මස 05 වැනි දින ඒ මැතිවරණ කොට්ඨාසයේ ඡන්ද විමසීම් පවත්වනු ලබන බව ද

මෙයින් දැනුම් දෙනු ලැබේ.

| | | |
|---|---|---|
| **මහින්ද දේශප්‍රිය,** | **එන්. ජේ. අබේසේකර,** | **එස්. රත්නජීවන් එච්. හූල්,** |
| සභාපති, | සාමාජික, | සාමාජික, |
| මැතිවරණ කොමිෂන් සභාව. | මැතිවරණ කොමිෂන් සභාව. | මැතිවරණ කොමිෂන් සභාව. |

2020 ජුනි මස 16 වැනි දින,
සරණ මාවත,
රාජගිරිය,
මැතිවරණ කොමිෂන් සභා කාර්යාලයේ දී ය.

1A - G 032262 — 67 (2020/06) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*